නාවික හා සාගරික විද්‍යාපීඨය
නාවික කඳවුර
ත්‍රිකුණාමලය

එන්එම්ඒ/සීඕ/එස්ඊසී/ඒඩීඑම්/බී/4/2022

බෙදාහැරීම බලන්න

2022 ජුලි 12

## <u>අණදෙන නිලධාරීගේ තාවකාලික සංදේශය අංක 16/2022</u>
## <u>නාවික හා සාගරික විද්‍යාපීඨයේ කාන්තා නාවිකයින් සහ පුහුණු කාන්තා නාවිකයින් ගේ වගකීම් හා විනය මනාව පවත්වා ගෙන යාම සඳහා උපදෙස් හා නියෝග</u>

1. නාවික හා සාගරික විද්‍යාපීඨයේ කාන්තා නාවිකයින් සහ පුහුණු වන කාන්තා නාවිකයින්ගේ විනය හා මනා පැවැත්ම කඩවන ආකරයේ ක්‍රියාවන් වාර්තා වීම හේතුවෙන් ඔවුන්ගේ වගකීම් හා විනය මනාව පවත්වාගෙන යාම <u>අධීක්ෂණ කිරීමට විද්‍යාපීඨයට අනුයුක්ත සියළුම නිලධාරිණියන් පත් කරන අතර,</u> විද්‍යාපීඨයට අනුයුක්ත කාන්තා නාවිකයින් සහ පුහුණු වන කාන්තා නාවිකයින් පහත දක්වා ඇති උපදෙස් හා නියෝග අනුව කටයුතු කල යුතුය.

අ. <u>නිවාසය භාර ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා සඳහා උපදෙස් හා නියෝග</u>

අ. නාවික හා සාගරික විද්‍යාපීඨයේ කාන්තා නිවස්නයේ නිවාස භාර නායක නැවි යන තනතුර සඳහා කාන්තා නිවස්නයේ සිටින සියළුම අංශයන්හි ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා පත්කර ගත යුතුය.

ආ. එම ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා නිවාඩු මත බැහැරව සිටින අවස්ථාවන්හිදී මීළඟට සිටින ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා එම වගකීම දැරිය යුතුය.

ඇ. විධාන භාර ආඥාපති තුමා, විධාන භාර නියෝජ්‍ය ආඥාපති තුමා, ආඥාපති තුමා සහ අණදෙන නිලධාරි තුමාගේ නිවාස චාරිකා වාරයන්, කඳවුරු චාරිකා වාරයන් පැවැත්වෙන දිනයන්හිදී නිවස්නය රපොර්තු කිරීමට ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා කඳවුරේ රැඳී සිටිය යුතු අතර, නොවැලැක්විය හැකි හේතුවක් නිසා නිවාඩු මත බැහැරව යන්නේ නම් මීළඟ ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා ඒ සඳහා පත්කල යුතුය.

ඈ. නිවාසය භාර ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා වශයෙන් තමා යටතේ සිටින සියළුම කාන්තා නාවිකයින් පිළිබඳ පූර්ව අවබෝධයකින් හා නිරීක්ෂණයකින් පසුවිය යුතු අතර, හැකි සෑම අවස්ථාවකම කාන්තා නාවිකයින්ගේ දෛනික චාර්යා රටාවන්, ඔවුන් සිදුකරනු ලබන කාර්යයන් හා ගමන් කරන ස්ථාන පිළිබඳව සොයා බැලිය යුතුය.

ඉ. කාන්තා නාවිකයින් සතියකට වරක් නිවාස භාර නායක නැවි විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ යුතු අතර, යම්කිසි ගැටළුකාරි තත්වයක් ඇති කාන්තා නාවිකයින් සිටිනම් ඔවුන්ගේ අංශභාර කණ්ඩායම් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

ඊ. කාන්තා නිවස්නයේ සිටින සියළුම කාන්තා නාවිකයින්ගේ විස්තර ඇතුළත් පොතක් නිවාසය භාර නායක නැවි විසින් යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.

උ. නිවාසය භාර නායක නැවි විසින් තම යටතේ සිටින කාන්තා නාවිකයින් හා පුහුණු කාන්තා නාවිකයින් සියළු දෙනාගේම සුභසාධනය පිළිබඳව සොයා බැලිය යුතු අතර, සියළුම කාන්තා නාවිකයින් හට ඇඳක්, ලොකරයක් ලබා දීමට කටයුතු කළ යුතුය.

උ. කාන්තා නාවික නිවාසයේ භාණ්ඩයන් හා දේපල තණ්ඩලේ ගබඩාවේ ඇති උප ලෙජරයන් මගින් නිවාසය භාර නායක නැවි විසින් ලිඛිතව නිසි පරිදි භාර ගැනීම සිදුකළ යුතු අතර, වෙනත් ආයතනයකට මාරුවී යාමේදී නිසි පරිදි භාණ්ඩ හා දේපල නිසි පරිදි ඇති බව සඳහන් කර තණ්ඩලේ ගබඩාවේ ඇති උප ලෙජරයේ අත්සන් කළ යුතුය.

එ. කාන්තා නාවිකයින්, උපදේශක කාන්තා නාවිකයින් හා පුහුණුවන කාන්තා නාවිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කර අංශභාර කණ්ඩායම් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

ඒ. කාන්තා නාවිකයින්,කාන්තා උපදේශක නාවිකයින් පුහුණු වන කාන්තා නාවිකයින් අනවශ්‍ය ලෙස කායික හා මානසික පීඩාවන් වලට ලක් නොකිරීමට කටයුතු කළ යුතු අතර, යම් වරදකට හෝ ක්‍රියාවකට දඬුවම් ලබා දීමට අවශ්‍ය නම් වගකිව යුතු නිලධාරියෙකු දැනුවත් කර ලැබෙන උපදෙස් මත ක්‍රියා කල යුතුය.

ඔ. කාන්තා නාවික නිවස්නයේ පිරිසිදු කිරීමේ කටයුතු සහ පිරිසිදුව තබා ගැනීම සම්බන්ධව නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු අතර, කාන්තා නාවිකයින් නිරන්තරයෙන් ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා නියෝග ලබා දෙමින් මෙහෙයවීමට කටයුතු කළ යුතුය.

ඕ. 2200 පැයෙන් පසු කාන්තා නාවික නිවස්නයේ සිටින සියළුම කාන්තා නාවිකයින්ගේ සාරංශයක් ලබා ගත යුතු අතර, සියළුම කාන්තා නාවිකයින් නිවස්නය තුල සිටින බවට ලිඛිතව තහවුරු කර ගත යුතුය.

ක. නිවාස භාර නායක නැවි වශයෙන් අනෙකුත් කාන්තා නාවිකයින්,උපදේශක කාන්තා නාවිකයින්ට හා පුහුණුවන කාන්තා නාවිකයින්ට ආදර්ශයක් වන අයුරින් තම චරිතය හා ක්‍රියාවන් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

ග. කාන්තා නාවික නිවස්නයේ අළුත්වැඩියා කටයුතු හා ගැටළුකාරී තත්වයන් සම්බන්ධයෙන් නාවික හා සාගරික විද්‍යාපීඨයට අනුයුක්ත සියළුම කාන්තා නිලධාරිනියන් දැනුවත් කිරීමට හා ඔවුන්ගේ උපදෙස් මත නිසි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නිවස්නය භාර කාන්තා නායක නැවි විසින් කටයුතු කළ යුතුය.

ආ. <u>උපදේශක කාන්තා නාවිකයින් සහ කාන්තා නාවිකයින් සඳහා උපදෙස් හා නියෝග</u>

අ. කාන්තා නාවික නිවාසයේ උපදේශක කාන්තා නාවිකයින් තම අංශයේ පුහුණුවන කාන්තා නාවිකයින්ගේ සියළුම විනය, මනා පැවැත්ම,පුහුණු කටයුතු, අධ්‍යයන කටයුතු, සුභසාධක කටයුතු සම්බන්ධව සියළු දේ පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතුය.

ආ. තමා යටතේ සිටින පුහුණු කාන්තා නාවිකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ යුතු අතර, යම් ගැටළු සහගත අවස්ථාවකදී අංශ ක්‍රමය අනුගමනය කරමින් ගැටළුව නිරාකරණය කළ යුතුය.

ඇ. නිවස්නයේ පොදු වැඩකටයුතු වලදී නිවාස භාර නායක කාන්තා නැවියාට උපරිම සහය ලබා දිය යුතු අතර, තමා යටතේ සිටින පුහුණුවන කාන්තා නාවිකයින් ඒ සඳහා යොමු කිරීමටද කටයුතු කළ යුතුය.

ඇ. දවසේ කාර්ය භාර නිලධාරි වාරිකා වාරය සඳහා නිවස්නය සූදානම් කිරීමට හා පිරිසිදු කිරීමේ වැඩකටයුතු සඳහා තම අංශයේ පුහුණුවන කාන්තා නාවිකයින් යෙදවීමට කටයුතු කළ යුතු අතර, එම කාර්යය අවසන් වන තෙක් පුහුණුවන කාන්තා නාවිකයින් පිළිබඳව නිරීක්ෂණය කළ යුතුය.

ඉ. පුහුණු වන කාන්තා නාවිකයින් අනවශ්‍ය ලෙස කායික හා මානසික පීඩාවන් වලට ලක් නොකිරීමට කටයුතු කළ යුතු අතර, යම් වරදකට හෝ ක්‍රියාවකට දඬුවම් ලබා දීමට අවශ්‍ය නම් නිවාසය භාර ජ්‍යෙෂ්ඨතම කාන්තා නාවිකයා හරහා වගකිව යුතු නිලධාරියෙකු දැනුවත් කර ලැබෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

ඊ. පුහුණු වන කාන්තා නාවිකයින් 1800 පැයට අධ්‍යාන කටයුතු සඳහා පාසල් වෙත ගමන් කරන්නේ නම් එම අංශයේ කාන්තා උපදේශක නාවිකයා අනිවාර්යෙන් සහභාගි විය යුතු අතර, නොවැලැක්විය හැකි හේතුවක් මත සහභාගි විය නොහැකි නම් වෙනත් අංශයක කාන්තා නාවික උපදේශකයෙකු සමඟ සහභාගි කරවීමට කටයුතු කළ යුතුය.

උ. උපදේශක කාන්තා නාවිකයන් , කාන්තා නාවිකයින්ට හා පුහුණුවන කාන්තා නාවිකයින්ට හා ආදර්ශයක් වන අයුරින් තම චරිතය හා පැවැත්ම පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.

ඌ. තම අංශයේ පුහුණුවන කාන්තා නාවිකයින් 2200 පැය වන විට නිවස්නයේ සිටිනවාද යන්න සනාථ කර ගත යුතු අතර, ඒ පිළිබඳව නිවාස භාර නායක නැව් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කළ යුතුය.

එ. ගිලන් වූ පුහුණු කාන්තා නාවිකයින් පිළිබඳව සොයා බැලිය යුතු අතර, ගිලන් තත්වය පිළිබඳව නිරතුරුව අවධානය යොමු කර ඔවුන්ගේ සුභසාධනය සොයා බැලිය යුතුය.

ඒ. නිවාස භාර නායක නැව් විසින් පනවා ඇති උපදෙස් හා නියෝගයන්ට අවනතව කටයුතු කළ යුතු අතර,පනවා ඇති උපදෙසක හෝ නියෝගයක වෙනස් කිරීමක් අවශ්‍ය වන්නේ නම් සාකච්ඡා කර විසඳා ගැනීමට කටයුතු කළ යුතුය.

ඇ. **<u>පුහුණු වන කාන්තා නාවිකයින් සඳහා උපදෙස් හා නියෝග</u>**

අ. පුහුණු වන කාන්තා නාවිකයින් නිවස්නයේ සිටින සියළුම ජ්‍යෙෂ්ඨ කාන්තා නාවිකයින් සඳහා නිසි ගෞරවය ලබා දිය යුතු අතර, නිවස්නය භාර ජ්‍යෙෂ්ඨ කාන්තා නාවිකයා හා උපදේශක කාන්තා නාවිකයින් විසින් පනවා ඇති උපදෙස් හා නියෝගයන්ට අවනතව කටයුතු කළ යුතුය.

ආ. නිවස්නයේ පිරිසිදු කිරීමේ කටයුතු, පොදු කටයුතු සඳහා ඍජු දායකත්වය සහ සහයෝගය අංශ භේදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුය.

ඇ. පුහුණු වන කාන්තා නාවිකයින්ට කාන්තා නාවික නිවාසයට අදාලව ඇති ගැටළු සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් නිවස්නය භාර ජ්‍යෙෂ්ඨ කාන්තා නාවිකයා හෝ උපදේශක කාන්තා නාවිකයා මගින් නිලධාරිනියක දැනුවත් කිරීමට කටයුතු කර විසඳා ගත යුතු අතර,මින් පරිභාහිරව ක්‍රියා කිරීමට කටයුතු නොකළ යුතුය.

ඈ. පුහුණු වන කාන්තා නාවිකයින් වශයෙන් වෙනත් රාජකාරීන් සඳහා අනුයුක්ත වීමේදී තම අංශයේ උපදේශක කාන්තා නාවිකයින් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

ඉ. පුහුණු වන කාන්තා නාවිකයින් විනය මනාව පවත්වා ගත යුතු අතර, නාවික හා සාගරික විද්‍යාපීඨයේ පනවා ඇති නියෝගයන්ට අනුකූලව පුහුණු කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුය.

උ. පුහුණු කාන්තා නාවිකයින් වෙනත් අංශයන්හි පුහුණුවන කාන්තා නාවිකයින් සමඟ සුහදව කටයුතු කළ යුතු අතර,ගැටළුකාරී අවස්ථාවන් වලදී තම අංශභාර කණ්ඩායම දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

ඌ. 2000 පැයෙන් පසු අධ්‍යාන කටයුතු සඳහා පාසල් වෙත පුහුණු කාන්තා නාවිකයන් සහභාගී වන්නේ නම් තම අංශයේ උපදේශක කාන්තා නාවිකයා සමඟ පාසල වෙත පැමිණිය යුතු අතර, කිසිම අවස්ථාවක තම අභිමතය පරිදි තනිවම ගමන් කිරීම නොකල යුතුය.

ඈ. <u>සියළුම කාන්තා නාවිකයින් සඳහා උපදෙස් හා නියෝග</u>

අ. කාන්තා නාවික නිවස්නය අවට පරිසරය මනා දැකුම්කළු ලෙස පවත්වා ගැනීම සියළුම කාන්තා නාවිකයින්ගේ වගකීම බව අවධාරණය කරන අතර, ඒ සඳහා ගෙමිදුල් අලංකරණ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති නාවිකයාගේ උපදෙස් ලබා ගෙන නිසි ලෙස එය සිදු කල යුතුය.

ආ. කාන්තා නාවිකයින් සඳහා නිවස්නයන් දෙකක් වෙන් කර ඇති අතර, මෙම නිවස්නයන්ගේ නඩත්තු කටයුතු මෙන්ම අලංකරණ කටයුතු සිදු කල යුතු අතර, නිසි බලධාරියෙකුගේ අවසරයකින් තොරව කිසිදු වෙනස් කිරීමක් සිදු නොකල යුතුය.

ඇ. නිවස්නයන් සඳහා ලබාදී ඇති ලෙජරයන් නිසිලෙස පවත්වා ගත යුතු අතර, එහි ඇති විෂයන් නිසි ලෙස භාවිතා කල යුතුය.

2. ඉහත සඳහන් උපදෙස් හා නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට කාන්තා නාවිකයින් හා පුහුණු කාන්තා නාවිකයින් විසින් කටයුතු කල යුතු අතර, ඊට පටහැනිව කටයුතු කරනු ලබන නාවික පුද්ගලයින් කාන්තා නාවිකයින් හා පුහුණු කාන්තා නාවිකයින් හට විනයානුකූලව කටයුතු කරන බැව් දැන්වේ.

එස්සී අන්නතුගොඩ,ආර්එස්පී**
කපිතාන්(අවි)
අණදෙන නිලධාරි

බෙදාහැරිම**:-** සම්පූර්ණ (අභ්‍යන්තර)